## මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු දෙපාර්තමේන්තු සේවකයින්ගෙන් මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/ යාන්ත්‍රික/ විදුලි ) පුහුණු ශ්‍රේණියට බඳවාගැනීමේ සීමිත තරග විභාගය - 2014 - 2015

01. මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු දෙපාර්තමේන්තු සේවකයින්ගෙන් මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/යාන්ත්‍රික/විදුලි) තනතුරුවල පවතින පුරප්පාඩු වලින් 30% ක් සඳහා බඳවා ගැනීමට සුදුසුකම්ලත් අයැදුම්කරුවන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. තෝරාගනු ලබන ක්‍රමය :-

2.1. පහත දැක්වෙන අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සහිතව ස්ථිර සේවා කාලය සම්පූර්ණ කරනු ලබන මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ තනතුරු දරණ හෝ මධ්‍යම පළාත් සභාවේ දෙපාර්තමේන්තුගත සේවයන් හි නියුතු වූවන්ට මේ සඳහා අයැදුම් කළ හැක.

2.2 ඒ සඳහා සුදුසුකම් සපුරන මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින්ගෙන් ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලබන අතර, ලිඛිත විභාගයේදී එක් එක් විෂයක් සඳහා අවම වශයෙන් ලකුණු 40% ක් වත් ලබාගන්නා අය බඳවා ගැනීම සඳහා සළකා බලනු ලබන අතර ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ.

03.

3: 1 බඳවා ගැනීමේ කොන්දේසි :

මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයැදුම්කරුවන් එක් අවුරුදු පුහුණු කාලයකට යටත්ව පත්වීම් දෙනු ලැබේ. පත් කරනු ලබන සේවා ස්ථානයේ වැඩ භාරගත් දින සිට අවුරුදු 03 ක අවම සේවා කාලයක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර එම කාලය තුළදී මධ්‍යම පළාතෙන් පිටතට ස්ථාන මාරුවීම් ලබා ගැනීමට හිමිකම් නොමැත.

3: 2 වැටුප් ක්‍රමයඃ-

මෙම නිලධාරීන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත්වන තුරු මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ . ( සටහන ii අදාළ වේ. )

04. බඳවා ගැනීමේ සුදුසුකම් :-

<u>පුහුණු කිරීමේ ශ්‍රේණියට</u>

(අ) අධ්‍යාපන සුදුසුකම් :-

භාෂාව හෝ සාහිත්‍යය , ගණිතය, විද්‍යාව යන විෂයයනට සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් 06 කින් සමත්වීම

සමඟ

අයැදුම් කරනු ලබන තනතුරට අදාළ ක්ෂේත්‍රයේ වසර 10ක පළපුරුද්දක් සහිත මධ්‍යම පළාත් සභාවට අයත් ආයතනයක, දෙපාර්තමේන්තුවක හෝ මධ්‍යම පළාත තුළ පළාත් පාලන ආයතනයක ක්ෂේත්‍රයට අදාළ පුහුණු කාර්මික සේවයක තනතුරු දරණ සේවයේ ස්ථිර කරන ලද සේවකයෙකු වීම.

(ආ) වෘත්තිය සුදුසුකම් :-
රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක ක්ෂේත්‍රයට අදාළ ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම (තුන් අවුරුදු අර්ධ කාලීන පුහුණු පාඨමාලාව හෝ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම).

සහ

(ඇ) පළපුරුද්ද :-
යටත් පිරිසෙයින් පුහුණු කාර්මික ශ්‍රේණියේ I පන්තියේ II ශ්‍රේණියේ වසර **05**ක *සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

"සතුටුදයක සේවා කාලය" යනුවෙන් අදහස් කරනුයේ,

(i) රජයේ නිලධරයකු විසින් කාර්යක්ෂමව හා අනලස්ව රාජකාරි ඉටු කිරීම මගින්ද, සමත්විය යුතුව තිබූ කාර්යක්ෂමතා කඩඉම සමත්වීම මගින්ද, සිදුකළ යුතුව තිබූ පත්වීම් ස්ථිර කිරීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කිරීම මගින්ද, එම කාලය තුළදී උපයාගත යුතුව තිබූ සියලුම වැටුප් වර්ධක උපයාගෙන ඇත්තා වූ සහ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු නොකරන ලද්ද වූ කාල සීමාවක් වන්නේය.

(ii) නිලධරයා වෙත ලබාදිය යුතුව තිබූ වාර්ෂික වැටුප් වර්ධක නිත්‍යානුකූල හේතුන් මත අත්හිටුවා, අඩුකොට හෝ විලම්භනය කොට ඇති කාල පරිච්ඡේදයක් වේ නම් එයද ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව පළමුවැනි උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදු කර ඇති විටක එම වරද සිදු කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් ද සහ ආයතන සංග්‍රහයේ II කොටසේ වැරදි පිළිබඳව දෙවන උපලේඛනය යටතේ දඬුවම් ලැබිය හැකි වරදක් සිදුකර ඇති විටක එම වරද සිදුකරනු ලැබූ දින සිට එක් වසරක කාලයක්ද සතුටුදයක සේවා කාලය ගණනය කිරීමේදී බැහැර කළ යුතු වන්නේය.

සටහන :-

i. දෙපාර්තමේන්තු පරීක්ෂණයක ප්‍රතිඵල මත පුහුණු කිරීමේ ශ්‍රේණියට තෝරා ගනු ලබන අයැදුම්කරුවන් අදාළ බඳවා ගැනීමේ පරිපාටියේ සදහන් පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත්වීමෙන් අනතුරුව මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියට ඇතුලත් කෙරේ.

ii. මෙම නිලධාරීන් පුහුණු කිරීමේ ශ්‍රේණියේදී තමන් කලින් දැරූ වැටුප් පරිමාණයේම තවදුරටත් රැඳී සිටිය යුතු අතර, පුහුණු පාඨමාලාව අවසානයේ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගය සමත්වන තුරු මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ බඳවා ගැනීමේ ශ්‍රේණියේ ආරම්භක වැටුප් වර්ධකයට සමාන වාර්ෂික දීමනාවක් වැටුපට අමතරව ගෙවනු ලැබේ. පුහුණු ශ්‍රේණියේ සතුටුදායක ලෙස ගත කරන නිලධාරියෙකු දෙවන වසරේදී තමන් මෙතෙක් සිටි වැටුප් පරිමාණයේම ඉහළ වැටුප් තලයේ පිහිටුවනු ලබන අතර, දීමනාව තවදුරටත් ගෙවනු ලැබේ. විභාගය සමත්වූ විට **2007.08.24** දිනැති අංක **06 / 2004** (IV) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි රු.15005 - 4 x 180 -6 x 240-11 x 320 - 20 x 360 = රු 27885/- ( MN 3- 2006(A) ) වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

iii. දෙවසරකට වඩා වැඩි පුහුණුවක් අවශ්‍ය යම් විශේෂ සේවා වෙතොත් එම අතිරේක සේවාවට සැලකීමක් වශයෙන් අතිරේක පුහුණු එක් වසරක් වෙනුවෙන් එක් වැටුප් වර්ධකයක් බැගින් ලබාදීමේ පදනම මත පුහුණු කාල සීමාව අවසානයේ III ශ්‍රේණියට බඳවා ගනු ලබන අතර, අතිරේක පුහුණු කාලසීමාවක් III ශ්‍රේණියට උසස් කිරීම සඳහා සලකා බලනු ලබන කාලසීමාවට ගණන් ගනු ලැබේ.

iv. අදාල පුහුණු කාල සීමාව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත්වීමට අපොහොසත් වන ආධුනිකයන් වෙතොත්, ඔවුනට මාස **06** කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාල සීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන් වෙතොත් ඔවුන් කලින් දැරූ තනතුරට පෙරලා යවනු ලැබේ.

v. සියලු අධ්‍යාපන සුදුසුකම් හා තාක්ෂණික සුදුසුකම් 2015.04.16 දිනට සම්පූර්ණ කර තිබිය යුතුය.

**05.** මධ්‍යම පලාත් තාක්ෂණ සේවය (සිවිල්/ යාන්ත්‍රික /විදුලි) පුහුණු කිරීමේ ශ්‍රේණියට අභ්‍යන්තර අයැදුම්කරුවන් බඳවා ගැනීමේ විභාගයේ විෂය නිර්දේශයඃ-

I. විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

1. දෙපාර්තමේන්තු රීති හා රෙගුලාසි පනත් පිළිබඳ හා ( සිවිල්/ යාන්ත්‍රික/ විදුලි ) ක්ෂේත්‍රයට අදාල විෂයානුබද්ධ දැනුම.
2. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය

II. විෂය නිර්දේශයඃ-

1. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය

   කාලය පැය 02 - ලකුණු 100

   සාමාන්‍ය දැනුම යටතේ පාරිසරික, විද්‍යාත්මක දැනුම දේශිය හා ජාත්‍යන්තර තොරතුරු පිළිබඳ දැනුම ද

   හා

   බුද්ධි පරීක්ෂණය යටතේ සංඛ්‍යා හැකියාව, ගැටළු නිරාකරණය, තර්කන ශක්තිය හා භාෂා හැකියාව ද මැන බැලීම සිදුකෙරේ.

   මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න වලින් සමන්විත වේ.

2. ක්ෂේත්‍රයට අදාල (සිවිල්/යාන්ත්‍රික/විදුලි) විෂයානුබද්ධ දැනුම

   කාලය පැය 03 - ලකුණු 100

- සිවිල් තනතුරට අයැදුම් කර ඇති අය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් හා නඩත්තු කටයුතු, මාර්ග තැනීම හා නඩත්තුව, ජල සම්පාදන හා ජල ප්‍රවාහනය සම්බන්ධව කාර්මික නිලධාරියෙකු සතු විය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ද,

- යාන්ත්‍රික තනතුරට අයැදුම් කර ඇති අය සඳහා යාන්ත්‍රික ඇඳීම පිළිබඳ යාන්ත්‍රික නිලධාරියෙකු සතු විය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ද

- විදුලි තනතුරට අයැදුම් කර ඇති අය සඳහා විදුලි කටයුතු පිළිබඳ කාර්මික නිලධාරියෙකු සතු විය යුතු දැනුම පරීක්ෂා කිරීම සඳහා ද, වන ව්‍යුහගත හා රචනා මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

III. සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා අවම වශයෙන් 40% ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

IV. අපේක්ෂකයන් අතුරින් ලකුණු ලබා ගැනීමේ ඉහලම ප්‍රමුඛතාවය මත සුදුස්සන් තෝරා ගනු ලබන අතර මෙම විභාගය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් පවත්වනු ලැබේ.

06. අයැදුම්කිරීමේ ක්‍රමය :-

6.1 මෙම නිවේදනයේ අග සඳහන් කර ඇති ආකෘතිය ප්‍රකාරව ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම භාවිතා කරමින් එහි පළමු පිටුවේ අංක. 01 සිට 05 දක්වා කරුණුද, අනෙක් පිටුවල ඉතිරි ජේදද ඇතුලත් වනසේ සකස් කර ගත් අයැදුම්පත්‍රය නිවැරදිව හා පැහැදිලිව පුරවා එවිය යුතුය. අයැදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/යාන්ත්‍රික/විදුලි) සීමිත තරග විභාගය සඳහා අයැදුම්පත", යන්න සඳහන් කළ යුතුය. මධ්‍යම පළාත් සභාවේ ආයතනයක, දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක පුහුණු කාර්මික සේවයක තනතුරු දරණ. අයැදුම්කරුවන් තම අයැදුම්පත්‍ර දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය. අයදුම්පත්‍ර සෑම ආකාරයෙන්ම සම්පූර්ණ විය යුතු අතර, අපැහැදිලි හා ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන අතර, අයැදුම්පත්‍රය හෝ ඒ සම්බන්ධ ලිපි හෝ තැපෑලේ දී නැති වූ බවට කරන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඇයැදුම්පත්‍රයක් නොඑවා ප්‍රමාද කිරීමෙන් විය හැකි අලාභයක් අයැදුම්කරුම විඳදරා ගත යුතුය. අයැදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයැදුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 2015 අප්‍රේල් 16 දින වේ.

6.2 එක් අයැදුම්කරුවෙකුට එක තනතුරකට වඩා අයැදුම්කළ නොහැකිය. ඒ අනුව තමාගේ තාක්ෂණික සුදුසුකම් හා සේවා පළපුරුද්ද සහිත ක්ෂේත්‍රය අනුව තමා වඩාත් කැමති තනතුරු වර්ගය සඳහා පමණක් අදාළ අයැදුම්කරුවන් අයැදුම් කළ යුතු වේ. මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/යාන්ත්‍රික/විදුලි) සීමිත තරග විභාගය සඳහා ඉල්ලුම් කරන නිලධාරීන්, මධ්‍යම පළාත් සභා ආයතනයක, දෙපාර්තමේන්තුවක හෝ පළාත් පාලන ආයතනයක ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාළ පුහුණු කාර්මික සේවයේ තනතුරක් දරණ අයෙකු විය යුතුය.

6.3 විභාග ගාස්තු :-

සෑම අයැදුම්කරුවෙකුම රු.600/- විභාග ගාස්තුවක් ගෙවිය යුතුය. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ආදායම් ශීර්ෂ 20-03-02-13 ට බැර වන පරිදි මධ්‍යම පළාත තුළ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මෙම විභාග ගාස්තු ගෙවා ඒ සඳහා ලබාගත් ලදුපතක් අයැදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගන්නා ලදුපත් හෝ චෙක්පත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ . අදාළ ලදුපත නොමැතිව එවන අයැදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරන අතර, ගෙවන ලද විභාග ගාස්තු කිසිම හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන බවද සැලකිය යුතුය.

6.4 මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන අයැදුම්පත් වලින් අදාළ විභාගයට පෙනීසිටීම සඳහා වූ අවශ්‍යතාවයන් සපුරා ඇති අයගේ අයැදුම්පත්‍ර විභාගය සඳහා යොමු කෙරේ. විභාගය පැවැත්වෙන දිනය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. ඒ අනුව අදාළ විභාග ප්‍රවේශ පත්‍ර විභාගය පැවැත්වීමට දින 14 කට පමණ පෙර අයැදුම්කරුවන් වෙත එවනු ලැබේ. විභාගයට පෙනීසිටීම සඳහා අදාළ විභාග ප්‍රවේශ පත්‍රය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් නොලැබුණු අපේක්ෂකයින් තම අයැදුම්පත්‍රය ඉදිරිපත් කිරීම පිළිබඳව තොරතුරු මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් වහාම විමසීමක් කළ යුතුය.

6.5 විභාග අපේක්ෂක අපේක්ෂිකාවන් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විභාග පැවැත්වීම පිළිබඳව පනවනු ලැබ ඇති නීතිරීතිවලට යටත් විය යුතුය.

6.6 විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් ලැබීම, අදාල අපේක්ෂකයා මූලික සුදුසුකම් සපුරා ඇතැයි යන්න පිළිගත් බැව් අදහස් නොකල යුතුය. විභාග ප්‍රතිඵල ලැබීමෙන් පසුව එම ප්‍රතිඵල අනුව සම්මුඛ පරීක්ෂණයට කැඳවීම් කලවිට තමාගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුය. අයැදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාල වෘත්තිය හා අනෙකුත් සුදුසුකම් ලබා නොසිටින්නාවූ අය අයැදුම්පත්‍ර එවීමෙන් වැළකී සිටීම මැනවි.

07. විභාග මාධ්‍යය :-

විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රිසී මාධ්‍යයෙන් පවත්වනු ලැබේ. අයැදුම්පත්‍රයේ තමන් විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය සඳහන් කළයුතු අතර, එය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

08. විභාග මධ්‍යස්ථානය :-

විභාග මධ්‍යස්ථානය පිළිබඳව මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයැදුම්කරුවන්ට දැනුම් දෙනු ලැබේ.

යම් හෙයකින් අභ්‍යන්තර අයැදුම්කරුවන් නොමැති වුවහොත් අභ්‍යන්තර අයැදුම්කරුවන් අතරින් සම්පූර්ණ කිරීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව බාහිර අයැදුම්කරුවන්ගෙන් සම්පූර්ණ කෙරේ. මෙම විභාග පැවැත්වීම පිළිබඳව හෝ පැවැත්වීමෙන් පසුව තෝරා ගැනීම් සිදු කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසාන තීරණය හා මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ ගැන ද පැහැදිලි කිරීම / තීරණය කිරීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

2015. මාර්තු මස 26 වැනි දින,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක:244, කටුගස්තොට පාර,
මහනුවර.

ආර්.එම්.එන්. රත්නායක,
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.

ආදර්ශ අයදුම්පත්‍රය

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ නියුතු දෙපාර්තමේන්තු/ ආයතන සේවකයින්ගෙන්</u>
<u>මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්/ යාන්ත්‍රික/ විදුලි ) පුහුණු ශ්‍රේණියට</u>
<u>බඳවාගැනීමේ සීමිත තරග විභාගය - 2014 - 2015</u>

විභාග අංකය ☐

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

---

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :- ☐ (සිංහල - S, දෙමළ -T, ඉංග්‍රීසි -E)
(අදාල සංකේතය කොටුව තුල ලියන්න)

01. තනතුර:- ☐ තනතුරට අදාල සංකේත අංකය ☐

පදිංචි දිස්ත්‍රික්කය:- ☐ දිස්ත්‍රික්කයට අදාල සංකේත අංකය ☐

1.1 මුලකුරු සමග නම:..........................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
1.2 මුලකුරු සමග නම:..........................................................................
(සිංහලෙන්/දෙමළෙන්)
1.3 මුලකුරුවලින් හැඳින්වෙන නම(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):-..........................................
..........................................................................................................
1.4 මුලකුරුවලින් හැඳින්වෙන නම (සිංහලෙන්/දෙමළෙන්): ..........................................
..........................................................................................................

02. 2.1 උපන් දිනය:-..............................................
2.2 2015.04.16 දිනට වයස :- අවු............... මාස.................... දින....................

2.3 ජාතික හැඳුනුම්පත් අංකය:- ☐☐☐☐☐☐☐☐☐☐

2.4 දුරකථන අංකය :- ..............................................
2.5 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- ..............................................

03. ස්ත්‍රී/පුරුෂභාවය:-..............................

04. සේවය කරන අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / ආයතනය :- ..............................
..........................................................................................................

05. අ. වර්තමාන සේවා ස්ථානය :- ..........................................................
..........................................................................................................

ආ. වර්තමාන තනතුර :- ..........................................................
..........................................................................................................

ඇ. වර්තමාන තනතුරට පත්වූ දිනය :- ..........................................................
..........................................................................................................

ඈ. එම තනතුරේ ස්ථිර කළ දිනය :- ..........................................................

06. අධ්‍යාපන සුදුසුකම්:-

6.1 අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය:-
වසර:-...................................................... විභාග අංකය:-....................................
පළමුවර:-

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

6.2 අ.පො.ස (උසස් පෙළ) විභාගය:-

වසර:-...................................................... විභාග අංකය:-....................................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

07. තාක්ෂණ සුදුසුකම්:-

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාල සීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා දිනය |
|---|---|---|---|---|
| | | | | |

08. ක්ෂේත්‍රයට අදාල පළපුරුද්ද:........................................................................
( සේවා කාලය සහ ආයතනය).........................................................................

08. වෙනත් සුදුසුකම් :-.........................................................................
.........................................................................

09. විභාග ගාස්තු ගෙවීම පිළිබඳ තොරතුරු

(I) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ
නම:–.........................................................................
.........................................................................
දිනය :– ..........................................................
(II) කුවිතාන්සි අංකය :- ..........................................................

| (මුදල් ගෙවා ලබාගත් ලදුපත මෙම තිරුව අසලින් අලවන්න) |
|---|

<u>අයදුම්කරුගේ ප්‍රකාශය</u>

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කර සිටිමි. මෙහි සඳහන් කරුණු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව අනාවරණය වුවහොත් මා සේවයට බඳවා ගැනීමට නුසුදුස්සකු වන බවත්, පත්වීමක් ලැබීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් සේවයෙන් පහකිරීමට යටත් වන බවත්, මා දනිමි.

දිනය:- .............................................                                        ..............................................................................................

අයදුම්කරුගේ අත්සන

10. මෙම අයදුම්කරු වන ..............................................................................................................................මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ...................................................................................................................... වශයෙන් සේවය කරන බවත්, මෙම අයදුම්පත්‍රයෙහි සපයා ඇති සියළුම තොරතුරු ඔහුගේ පුද්ගලික ලිපි ගොනුව / සේවා වාර්තා සමග සන්සන්දනය කළ බවත්, ඒවා නිවැරදි බවත් මෙයින් සහතික කරමි. දැනට ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක වන අතර පසුගිය වසර 05ක කාලය තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ ( සිවිල් / යාන්ත්‍රික / විදුලි ) පුහුණු ශ්‍රේණියට අයදුම් කිරීමට ඔහුට / ඇයට සුදුසුකම් තිබෙන බවත්, පත්වීමක් සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි / නොහැකි බවත් සහතික කරමි.

..............................................................................................

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :- ..................................................................

තනතුර :- ..................................................................

දිනය :- ..................................................................

(නිල මුද්‍රාව සහිතව)